10. *ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර :*

(අ) (i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර 21x29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල තමන් ඉල්ලුම්පත්‍ර සකසා ගත යුතු අතර ඉල්ලුම්පතේ 01 වැනි පිටුවේ අංක 01 සිට 04 දක්වාත්, 02 වන පිටුවේ අංක 05 සිට 09 දක්වාත්, 03 වන පිටුවේ අංක 10 සිට 12 දක්වාත් ඡේදයන් ඇතුලත් විය යුතු අතර, විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඊට පහළ කොටසේ ඇලවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර - විවෘත" යනුවෙන් සඳහන් කර 2018.08.20 දින හෝ ඊට පෙර මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතු ය.)

(ii) අසම්පූර්ණ, නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත්‍ර ගැන වගකියනු නොලැබේ.

(iv) මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකරයි.

(v) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

(ආ) ඉල්ලුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව වෘත්තීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය හැක.

11. පහත සඳහන් ලියවිලි ද කැඳවීමක් කරනු ලබන අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.
   (i) උප්පැන්න සහතිකය
   (ii) අධ්‍යාපන සහතික
   (iii) මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකයක්
   (iv) චරිත සහතික දෙකක්

*සැලකිය යුතුයි*-අධ්‍යාපන, වෘත්තීය හා උප්පැන්න සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

12. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

13. විභාග ගාස්තුව රු. 800 කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට්පත, අයදුම්පතේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතුය. මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.

14. *විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන*
ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් සුදුසු මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

15. *විභාගයට ඇතුලුවීම :*
අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අපේක්ෂකයන්ට ඔවුන් අයදුම්පතේ සඳහන් කළ ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපෑලෙන් යැවෙනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන*.- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවේ.

16. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*
විභාග ශාලාවේදී එහි විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරු සිය අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.
(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

17. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එහි සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ ඔහු/ඇය තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

18. *භාෂා මාධ්‍යය :*
මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන අතර අයදුම්කරුවන්ට කැමති මාධ්‍යකින් ඒ සඳහා ඉදිරිපත් විය හැක. අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

19. මෙම කොන්දේසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් තීරණය කෙරෙනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2018 ජූලි මස 05 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය*

*ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 සඳහා ආදර්ශ අයදුම්පත*

**Specimen Application form for the open Competitive Examination for recruitment to the Post of Survey Instrument Technician Grade III - 2018 in the Department of Survey.**

ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද ඇතුලත් කළ යුතුය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා, මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA A. B. C.

1.2 සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 දුරකථන අංකය (තිබේනම්) :————.

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
3.3 පදිංචිව සිටින කාල සීමාව :————.
3.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

4.0 උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
2018 . . . . . . . වැනි දිනට වයස : අවු. :————. මාස :————. දින :————.

5.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)
5.1 අ.පො.ස. (සා.පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ. පො. ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

6.0 වෘත්තීය සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)
6.1 හදාරා ඇති පාඨමාලාව :————.
6.2 පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම :————.
6.3 පාඨමාලාවේ කාලය :————.

7.0 වෙනත් සුදුසුකම් :————.

8.0 ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

ඔව් ☐ නැත ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න :————.

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල : රු. :————.

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.) |
|---|

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වේ. තව ද, මෙහි සියලු කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.
(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කර සිටිමි.
(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............... මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............ දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි)

12.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතන වල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .............................. මයා/මිය/මෙය ......... දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......... දින සිට ......... දින දක්වා ......... වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ................. තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.